# රහස්‍ය භාවය නිසාම හෙළිදරව් නොවන විභාගවල අම්හිරි අත්දැකීම් ....... 1




ශ්‍රී ලංකාවේ තවමත් පවතිනුයේ බොහෝදුරට විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයකි. රටෙහි වාසනාවට දැනට මෙම ක්‍රමය සංශෝධනය කිරීමට පියවර ගනිමින් තිබෙන බව පෙනේ. කිසි දිනක හෙළි නොවන විභාග රස කතා එමටය.

මා ඒ කාළයේ සේවය කළේ විභාග දෙපාර්තමේන්තුවේ අගයීම් ශාඛාවේය. අපොස සාමාන්‍ය පෙළ විභාගයේ විද්‍යාව විෂයය භාරව කටයුතු කිරීම මා වෙත පැවරී තිබුණි. ගණිතය විෂයය භාරව සිටියේ අප සමග එක්ව වැඩකළ තවත් නිලධාරියෙකි. එම වර්ෂයේ ගණිත ප්‍රශ්න පත්‍රයේ බහුවරණ ප්‍රශ්නයක එක් වචනයක අඩුපාඩුවක් නිසා රටෙහි මහත් ආන් දෝලනයක් ඇති විය. දවස ඇතුලත විභාග කොමසාරිස් තුමාට ටෙලිෆෝන් පණිවුඩ සිය ගණනක් ලැබී ඇත.

මෙය සැලවූ වහාම විභාග කොමසාරිස් තුමා විසින් ගණිත විෂයයේ ප්‍රධාන පරීක්ෂක වරයා සහ අප තව කිහිප දෙනෙකු කැඳවා, සාකච්ඡා කර, උත්තර පත්‍ර අගැයීම් කටයුතු වලදී, සිසුනට අසාධාරණයක් නොවන පරිදි ඒ සඳහා ගතයුතු ක්‍රියා මාර්ගය සාකච්ඡා කර තීරණය කරන ලදී.

(මෙවැනි අවස්ථාවකදී කරනුයේ අඩුපාඩුව තිබෙන එම බහුවරණ ප්‍රශ්නයේ, සියලූම වරණ නිවැරදි ලෙස සලකා, පිළිතුරු නොසැපයූ අය ඇතුළුව සියළුම අයදුම් කරුවන්ට නියමිත ලකුණ දීමයි. මේ නිසා කිසිවෙකුට අසාධාරණයක් සිදු නොවේ.)

පසු දින පුවත් පත්වල මෙම සිද්ධිය පළකර තිබුණු අතර, එක් පුවත් පතක කතුවැකිය මගින් අධ්‍යාපන අමාත්‍යංශයට සහ විභාග දෙපාර්තමේන්තුවට තදින්ම දොස් පවරා තිබුණි. මෙ ගැන අධ්‍යාපන අමාත්‍යංශයටද ටෙලිෆෝන් පණිවුඩ රාශියක්ද ලැබී ඇති බවද දැන ගතිමු.

එදින දහවල් දහයට පමණ අධ්‍යාපන ඇමති තුමා විභාග කොමසාරිස් තුමාට කථා කර "ඔන්න විභාග ප්‍රශ්න පත්‍රයක වැරැද්දක්. මේ වැරදි කරන නිලධාරි කව්ද? ගණිතය විද්‍යාව ප්‍රශ්න පත්‍ර භාර ප්‍රධාන නිලධාරීන් සමග මේ ගැන කථා කිරීමට වහාම මගේ කාර්යාලයට එවනවා හොඳයි" කියා තර්ජනාත්මක නියෝගයක් කර ඇත. එසේ කියා අවසන් කළ විගසම, මෙම සිද්ධිය පිළිබඳව ගත් පියවර ගැන කිසිම පැහැදිලි කිරීමක් කිරීම සඳහා විභාග කොමසාරිස්ට අවස්ථාවක් නොදී, ඇමති තුමා ටෙලිෆෝනය විසන්ධි කර තිබේ. ගණිත ප්‍රශ්න පත්‍රයේ දෝෂය වෙනුවෙන් මාද කැඳවා තිබීම අපට මහත් ගැටළුවක් විය. විභාග කොමසාරිස් තුමා අප කැඳවා වහාම අධ්‍යාපන ඇමති තුමා හමුවීමට යන ලෙස දන්වන ලදී.

ඒ වන විටත් සකස් කර තිබුණු සංශෝධිත ලකුණු දැමීමේ ක්‍රියා පටිපාටිය සහ අදාළ ප්‍රශ්න පත්‍රද රැගෙන අපි ඇමති තුමා හමුවීමට ගියෙමු. ඇමති කාමරයට ගොස් අමුත්තන් සඳහා පනවා තිබුණු පුටු දෙකක හිඳ ගතිමු.

අප සමග කිසිවක් කථා නොකළ ඇමති තුමා, තමා ඉදිරියේ තිබුණු එදින පුවත් පතක කතු වැකිය පෙරළා, අපට දිගු කළේය. එය අතට ගත් මගේ මිතුරා යමක් කීමට සැරසෙන විටම අතින් සන් කර එය නතර කළ ඇමති තුමා, මෙසේ අප ඇමතීය.

"මේ දෙන්නම ගණිත ප්‍රශ්න පත්‍රතය හදපු අයද?"

"මම කළේ විද්‍යාව ප්‍රශ්න පත්‍රය" මම පිළිතුරු දුනිමි.

"එහෙනම් මේ කතාවට ආවේ මොකටද?" ඔහු මගෙන් ඇසීය

"එන්නට කියා පණිවුඩයක් දී තිබුණු නිසා " මම කීවෙමි.

"හා මටයි වැරදුනේ. මම හිතුවේ ගණිතය, විද්‍යාව දෙකේ ම ප්‍රශ්න පත්‍ර හදන්නේ එකම කණ්ඩායමය කියා." ඇමති තුමා කීවේය.

හොඳට හරි බරි ගැසී පුටුවේ වාඩිවූ ඇමති තුමා

"පේනවා නේද පත්තර වලින් අපට දොස් කියනවා. දෙමව්පියෝ අපිට බනිනවා. මේ වැඩේ හරියට කරන්නට බැරිනම්, එක්කෝ ඔහෙලා යන්න ඕනෑ. නැත්නම් මම යන්න ඕනෑ. මොකද කියන්නේ?"
එය ඇමති තුමා විසින් අපට කරන ලද ගේ තර්ජනයකි.

ටික වෙලාවක් නිශ්ශබ්දව සිටි මගේ මිතුරා "සර්, මම රජයේ සේවකයෙක්. ජීවත් වෙන්නේ මේ පඩියෙන්. මට නම් යන්නට බැහැ." යයි එඩිතරව කීවේය.

මෙම ප්‍රකාශයෙන් තරමක් පසුබෑ ඇමති තුමා,
"ඒ කියන්නේ මට යන්න කියනවාද?" කියා තරමක් උස් හඬකින් සහ මඳ සිනහවක් සහිතව ඇසුවේය.

පසුබට නොවූ අප මිතුරා තරමක් හෙමිහිට "ඒක සර්ගේ කැමැත්තක්" යයි ඇඟට නොදැනී කියන විට තරමක් උස් හඬින් සිනහ වූ ඇමති තුමා
"මේ අවනම්බුවෙන් ගොඩ එන්නේ කොහොමද?" කියා අපෙන් නැවතත් ප්‍රශ්න කරන ලදී.

අප විසින් එම ගැටලූව විසඳීම සඳහා ගන්නා ලද ක්ෂණික පියවර සහ සිසුනට කිසිම අසාධාරණයක් නොවන ලෙස උත්තර පත්‍ර ඇගයීම කළ හැකි ආකාරය හොඳින් පැහැදිලි කරදුන් පසු

"එහෙනම් වැඩේ ලෙහෙසියෙන්ම හමාර කරලා නේද?" කියා සහකාර ලේකම් කෙනෙකුට කථාකර, පත්‍ර පිටුවද ඔහුට දී මෙවැනි උපදෙසක් දුන්නේය.
"ඔය විභාග ප්‍රශ්න පත්‍රයේ අඩුපාඩුව විසඳන ආකාරය ගැන මේ අයගෙන් තොරතරු ලිඛිතව ලබාගන්න. ඊටපසු, අද පත්‍රයේ කතුවැකියෙන් පෙන්වා දුන් කාරණය පිළිබඳව, මගේ උපදෙස් පරිදි, සිසුනට අසාධාරණයක් නොවන ලෙසට වහාම පියවර ගත් බව පත්‍රයට දන්වා යවා, අනිකුත් පත්‍ර වලටත් ලියුම බැගින් යවන්න"

අවසානයේදී "මගේ උපදෙස් පරිදිල කියා, ඒ වැඩෙනුත් ඇමති තුමාට ලකුණු වැඩියෙන් ලැබෙන්නට ඇති.

එක් වචනයක එම දෝෂය අවසාන ශෝධු පත්‍ර බැලීමේදී සිදුවූ ප්‍රමාද දෝෂයකි. ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේදී හෝ මුද්‍රණයේදී සිදුවන ඉහත සඳහන් කළ සිද්ධිය මෙන්ම උත්තර පත්‍ර ලකුණු කිරීමේදීද හාස්‍යය මුසු සිද්ධීන් හමුවේ.

දශක හතරකට පමණ ඉහතදී, ලකුණු කිරීමට නියමිත උත්තර පත්‍ර , අදාළ පරීක්ෂක වරයාගේ පෞද්ගලික ලිපිනයට, තැපෑලෙන් යවන ලද අතර, ඔහුට අභිමත ස්ථානයක සිට ලකුණු කිරීම සඳහා අවසර තිබිණ.

එහෙත් පසුව, මෙම ක්‍රමය වෙනස් කර, ප්‍රධාන පරීක්ෂක වරයෙකුගේ අධීක්ෂ ණය යටතේ, විසි දෙනෙකුගෙන් පමණ සමන්විත සහකාර පරීක්ෂක කණ්ඩායමක් (පැනලයක්) විසින් ලකුණු කිරීමේ (ඇග යීමේ) වැඩ පිළිවෙලක් සකස් කරන ලදී. මෙම ක්‍රමයේදී, කණ්ඩායම එක් ස්ථානයක (පාසල් පන්ති කාමරයක) රැස්වී අවශ්‍ය නම් ගැටළුද සාකච්ඡා කරමින් ලකුණු කිරීම, වඩාත් එලදායී පිවිසුමක් විය. ප්‍රශ්න පත්‍රයේ ඇති ප්‍රශ්න වලට අනුකූලව, කලින් සකස් කරනු ලබන සම්මත ලකුණු දැමීමේ ක්‍රමය (ජ්රනසබටි ජයැපෑ) සියලූ දෙනාම විසින් ඒ ලෙසටම අනුගමනය කිරීම මෙහිදී වැදගත් කාර්යයකි.

මටද, වසර කිහිපයක්ම විද්‍යාව විෂයයේ ප්‍රධාන පරීක්ෂක වරයෙකු ලෙස, වරින් වර කොළඹ, කළුතර, හොරණ, ගාල්ල සහ රත්නපුර යන නගරවල විද්‍යාව ඇගයීම් මණ්ඩල භාරව කටයුතු කිරීමේ අවස්ථාව ලැබුණි.

එක දිගට දින දහයක් පමණ එක තැනක සිට මනා සංයමයකින් යුතුව කරනු ලබන මෙම ඇගයීමේ ක්‍රියාවලිය සඳහා, ගෙවීමක් කරනු ලැබූවත්, එය අගනා සේවයක් ලෙස සැලකිය හැකිය. ප්‍රශ්න පත්රෙයේ දී ඇති ප්‍රශ්න වල, එක් එක් පිළිතුරට අයදුම් කරු ලබාගන්නා ලකුණු සහ බහුවරණ ප්‍රශ්න පත්රපයේ ලකුණුද, ක්‍රමානුකූලව එකින් එක ලකුණු ලේඛනයට නිවැරදිව ඇතුලත් කිරීම ඉතා ප්‍රවේශමෙන් කළයුතු ක්‍රියාවලියකි. මේ සඳහා යහපත් මානසික ඒකග්‍රතතාවක් තිබිය යුතුය. අපොස සාමාන්‍ය පෙළ ඇගයීම් සඳහා තෝරා ගනු ලබන්නේ, අදාළ විෂයය පාසල්වල ඉගැන්වීම කරන, විදුහල්පතිවරුන් විසින් නිර්දේශ කරනු ලබන, පළපුරුදු ගුරුවර ගුරුවරියන් පමණකි.

දූෂණ අඩුකර විභාග පැවැත්වීම සඳහා කෙතරම් නීති රීති පනවා තිබුණත්, සමහර අයදුම් කරුවන් විසින්, නොදැනුවත්ව හෝ වංචා සහගත සිතින් කරනු ලබන දූෂිත ක්‍රියා බොහෝය. 2017 දෙසැම්බර් සාමාන්‍ය පෙළ විභාගයේ තත්ත්වය පුවත් පතක මෙසේ දක්වා තිබිණ.

කණ්ඩායම් ඇගයීම් වලදී විවිධ ගැටළු සහ සිද්ධි දකින්නට ලැබෙන අතර, අපට හමුවූ හාස්‍ය ජනක වුවත්, අවාසනාවන්ත සිද්ධීන් කිහිපයක් මෙහි සඳහන් කරමි.

1. වෙනත් කිසිවක් නොලියා, සම්පූර්ණ ප්‍රශ්න පත්රපයම, කිහිප වරක් උත්තර පත්‍රයේ පිටපත් කර තිබීම.

   මෙය පෞද්ගලික අයදුම් කරුවෙකුගේ උත්තර පත්‍රයක් විය. කෙසේ හෝ විභාගය පැවැත්වූ ශාලාවේ සිටි නිරීක්ෂකයින්ටද මෙය හසුවී නැත. පරීක්ෂකවරයා එම උත්තර පත්‍රය මා වෙත උපදෙස් සඳහා යොමු කළේය. උත්තර පත්‍රයට කිසිම ලකුණක් දීමට හැකියාවක් නොතිබුණි. ලකුණු බින්දුවක් දමා, ලකුණු ලේඛනයේ ද බින්දුව දමා, විශේෂ සටහනක්ද යොදා, අත්සන් කර, ජර්නලයේද සටහනක් යෙදුවෙමි. එම උත්තර පත්‍රය පැකට්ටුවෙන් ඉවත් කර විශේෂ කවරයක බහා විභාග දෙ පාර්තමේන්තුවේ විමර්ශන ශාඛාව වෙත වැඩිදුර කටයුතු සඳහා යවන ලදී.

   ඔහුට හිමිවුයේ ලකුණු බින්දුව නිසා විෂයය ප්‍රතිඵලය වූයේ "අසමත්" යන්න වූ අතර පසු විපරම් කිසිවක් නොකරන ලදී.

   කෙසේ වෙතත්, එම අයදුම් කරු මා නසික ආබාධයකින් පෙළෙන අයෙකුද යන්න සොයා බැලීමට අදාළ ආයතනයකට යොමු කිරීමට මගක් තිබුණේදැයි නොදනිමි.

2. උත්තර පත්‍රයට මුදල් නෝට්ටුවක් අමුණා තිබීම.

   මෙම උත්තර පත්‍රය තිබුනේ පරීක්ෂක වරියකට ලැබුණු පැකට්ටුවකය. අයදුම්

20 වන පිටට